ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග[1]

(ශ්‍රී ලංකා මහ බැංකුවේ 2024 වාර්ෂික ආර්ථික විවරණයට අතිරේකයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී)

මුදල් ප්‍රතිපත්තිය

2024 පෙබරවාරි 09	-	2024 පෙබරවාරි 16 වැනි දිනෙන් ආරම්භ වන සංචිත පවත්වාගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි, නිත්‍ය ණය පහසුකම මත පනවා තිබූ සීමාව ඉවත් කෙරුණු අතර, නිත්‍ය තැන්පතු පහසුකම මත පනවා තිබූ සීමාව මාසයක් තුළ පස් වතාවක (05) සිට දස වතාවක් (10) දක්වා ලිහිල් කරන ලදී.[2]
2024 මාර්තු 26	-	2024 අප්‍රේල් මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම සඳහා පැවති සීමාව ඉවත් කරන ලදී.
	-	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 8.50%ක් සහ 9.50%ක් දක්වා අඩු කරන ලදී.
2024 ජූලි 24	-	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින්, පිළිවෙළින්, 8.25%ක් සහ 9.25%ක් දක්වා අඩු කරන ලදී.
2024 නොවැම්බර් 27	-	මහ බැංකුව පැවති ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් වෙත යොමු විය. ඒ අනුව, මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීමට භාවිත කරන ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) හඳුන්වා දෙන ලද අතර, එය පදනම් අංක 50ක අඩු කිරීමක් පිළිබිඹු කරමින් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 8.00%ක් ලෙස තීරණය කරන ලදී. තවද, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක ± 50ක ආන්තිකයක් සමඟ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ කරමින්, පිළිවෙළින්, 7.50% සහ 8.50%ක් ලෙස නම් කරන ලදී.[3]

විශේෂ ණය යෝජනා ක්‍රම

2024 ජනවාරි 03	-	ඉදිරියේ දී රජයේ අරමුදල් මගින් හෝ අරමුදල් සපයනු ලබන නියෝජිත ආයතනවල අරමුදල් භාවිතයෙන් ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක නොකිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. නමුදු දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ණය යෝජනා ක්‍රමයන්හි මෙහෙයුම් කාලය අවසන් වනතෙක් එම ණය යෝජනා ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරනු ඇත.

[1] 2024 ජනවාරි 01 සිට 2025 මාර්තු 15 දක්වා වන කාලය තුළ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

[2] මහ බැංකුවේ නිත්‍ය පහසුකම් මත සහභාගීත්ව ආයතන අධික ලෙස රඳා පැවතීම අඩු කිරීමේ අරමුණින්, 2023 ජනවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය පහසුකම් සඳහා සීමාවන් පනවන ලදී.

[3] නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය තවදුරටත් මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස සලකනු නොලබන අතර, සහභාගීත්ව ආයතනවලට නිත්‍ය පහසුකම් සඳහා අදාළ වන අනුපාතික ලෙස අඛණ්ඩව ක්‍රියා කරයි.

	-	2025 වසරේ පළමු වාරයේ සිට නව විස්තීරණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (New Comprehensive Rural Credit Scheme) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක නොකිරීමටත්, අදාළ ණය ඇපකර අරමුදල මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත ලබා දීමටත් ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත.
2024 අගෝස්තු 28	-	කලත්‍රයා, දරුවන් සහ දෙමව්පියන්ට අමතරව "සහෝදර සහෝදරියන්" ද තම පවුලේ සමීපතම සාමාජිකයන් ලෙස ඇතුළත් කිරීම සඳහා ශ්‍රී ලාංකික විදේශ සංක්‍රමණික සේවකයන් සඳහා වූ "මනුසවි" ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී.

ගෙවීම් හා පියවීම්

2024 ජනවාරි 17	-	ජස්ට්පේ (JustPay) ගනුදෙනු සිදු කළ හැකි ජංගම ගෙවීම් යෙදුම් තුළින් සිදුවන ගනුදෙනු සඳහා 2024 වසරේ ජනවාරි 01 වන දින සිට, ගනුදෙනුවක වටිනාකම රුපියල් 10,000ට සමාන හෝ ඊට වැඩි නම්, ජස්ට්පේ ගනුදෙනුව ආරම්භ කරන ජංගම ගෙවීම් යෙදුම් මගින් එම ජංගම ගෙවීම් යෙදුම හා සම්බන්ධ කර ඇති ගිණුම අයත් මූල්‍ය ආයතනයෙන් එක් වරක් භාවිතා කළ හැකි මුරපදයක් (One-Time-Password) ඉල්ලා සිටීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනිවාර්ය කරන ලදී. ජස්ට්පේ ජංගම යෙදුම පරිශීලකයාට ඕනෑම මූල්‍ය ආයතනයක ඇති ඔහුගේ ජංගම ගිණුම් හෝ ඉතුරුම් ගිණුම් ගෙවීම් යෙදුමට සම්බන්ධ කිරීමට සහ එවැනි ගිණුම්වලින් අරමුදල් ලබාගැනීමෙන් ගෙවීම් සිදු කිරීමට හැකියාව ලබාදේ.
2024 පෙබරවාරි 01	-	NEPALPAY QR ජංගම යෙදුම හරහා නේපාල සංචාරකයින් සිදු කරන ගනුදෙනු පිළිගැනීම සඳහා ලංකාපේ පුද්ගලික ආයතනයට නේපාල නිෂ්කාශන ආයතනය හා සම්බන්ධ වීමට අනුමැතිය ලබාදෙන ලදී.
2024 අප්‍රේල් 20	-	2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ විධිවිධාන යටතේ 2024 අංක 1 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග නිකුත් කරන ලදී. ඒ අනුව, මෙම නියෝග මගින් සියලුම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් 2024 වසරේ ජූනි 03 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම අවශ්‍ය වන අතර, එමගින් ලියාපදිංචි නොකළ හෝ බලපත්‍ර රහිත මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් හට ඔවුන්ගේ මෙහෙයුම් විධිමත් කිරීමට සහ විධිමත් මාර්ග හරහා මුදල් හුවමාරු ව්‍යාපාරයේ නිරත වීමට අවස්ථාව ලබා දේ.
2024 දෙසැම්බර් 03	-	ගනුදෙනුකරුවන්ගේ ජංගම ගිණුම්/ඉතුරුම් ගිණුම් අනවසර ප්‍රවේශයන්ගෙන් ආරක්ෂා කරගැනීම අරමුණු කර ගනිමින්, ගෙවීම් යෙදුම් වෙත ලියාපදිංචි වීමේ දී පරිශීලකයා හඳුනා ගැනීම සහ පරිශීලකයින් විසින් සපයනු ලබන තොරතුරු තහවුරු කරගැනීම සඳහා තොරතුරු ලබාගැනීමට සුදුසු යාන්ත්‍රණයක් 2025 වසරේ මාර්තු 31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාපිත කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලුම ජංගම ගෙවීම් යෙදුම් සැපයුම්කරුවන් හට උපදෙස් ලබාදෙන ලදී. තවද, ජංගම ගිණුම්/ඉතුරුම් ගිණුම් ජස්ට්පේ පහසුකම සහිත ගෙවීම් යෙදුමකට සම්බන්ධ

කිරීමේ දී ගෙවීම් යෙදුමේ පරිශීලකයා සහ ජංගම ගිණුම්/ඉතුරුම් ගිණුම් හි හිමිකරු එකම අයෙකු බව සහතික කරගන්නා ලෙස ජංගම ගෙවීම් යෙදුම් සැපයුම්කරුවන් වෙත උපදෙස් දෙන ලදී.

2024 දෙසැම්බර් 20 - 2025 වසරේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි LANKAQR ගනුදෙනුවල උපරිම වෙළඳ වට්ටම් අනුපාතය (MDR) ගනුදෙනු මුදලින් 1%ක් දක්වා නැවත ස්ථාපිත කරන ලදී. තවද, LANKAQRහි උපරිම ගනුදෙනු සීමාව රුපියල් 200,000/- සිට රුපියල් 500,000/- දක්වා වැඩි කරන ලද අතර LANKAQRහි අවම ගනුදෙනු සීමාව රුපියල් 10/- සිට රුපියල් 1/- දක්වා අඩු කරන ලදී.

2025 ජනවාරි 27 - ඩිජිටල් ගනුදෙනු ප්‍රවර්ධනය කිරීම සඳහා, ඩිජිටල් ගෙවීම් ලබාගැනීමට හැකි තොරතුරු තාක්ෂණ පද්ධතියක් නොමැති රාජ්‍ය ආයතන වෙත ඩිජිටල් ගෙවීම් පිළිගැනීම පහසු කිරීමට හඳුන්වාදුන් ගෙවීම් වේදිකාව වන GovPay හරහා සිදු කරනු ලබන එක් ගනුදෙනුවක් සඳහා අයකළ හැකි උපරිම ගාස්තුව 2025 වසරේ පෙබරවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් 15/-ක් ලෙස නියම කරන ලදී.

2025 පෙබරවාරි 07 - ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අන්තර්ජාල බැංකුකරණය, ජංගම යෙදුම් සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයකුගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතා කර විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (Common Electronic Fund Transfer Switch) හරහා සිදු කෙරෙන ගනුදෙනුවක් වෙනුවෙන් අය කළ හැකි උපරිම ගාස්තුව 2025 වසරේ පෙබරවාරි 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් 25/-ක් ලෙස තීරණය කරන ලදී. තවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව වැනි ආයතනවලට ගෙවීම් සිදු කිරීම සඳහා පහසුකම් සපයන ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LankaPay Online Payment Platform) හරහා සිදු කරනු ලබන ගනුදෙනුවක් වෙනුවෙන් අය කරනු ලබන උපරිම ගාස්තුව එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 25/- නො ඉක්මවිය යුතු බව ද තීරණය කරන ලදී.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

2024 අප්‍රේල් 01 - 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ ආයතන විසින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත අනිවාර්යයෙන් ලබා දිය යුතු වාර්තා සම්බන්ධයෙන් වන අනුකූලතාවය පිළිබඳව ආයතන වෙත 2024 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2024 සැප්තැම්බර් 05 - මූල්‍ය ආයතන විසින්, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතින්ට අනුකූලවීම සම්බන්ධයෙන් මූල්‍ය ආයතන වෙත 2024 අංක 02 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2024 සැප්තැම්බර් 19 - රක්ෂණ ආයතන විසින් ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතින්ට අනුකූලවීම සම්බන්ධයෙන් රක්ෂණ ආයතන වෙත 2024 අංක 02A දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2024 ඔක්තෝම්බර් 02 - 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන යටතේ පරිසීමිත වෙළඳුන්ගේ ආයතනික අනුකූලතාව සහතික කිරීම සම්බන්ධයෙන් පරිසීමිත වෙළඳ ආයතන වෙත 2024 අංක 03 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2024 නොවැම්බර් 04 - 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට සහ 2018 අංක 1 දරන නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන්ට අනුකූල වීම සම්බන්ධයෙන් 2024 අංක 04 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.

විදේශ විනිමය කළමනාකරණය සහ ජාත්‍යන්තර කටයුතු

2024 ජනවාරි 01 - 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ 2023 වසරේ පෙබරවාරි 27 දිනැති ජංගම ගනුදෙනු සඳහා වන "විශේෂ විදේශ මුදල් ගිණුම් - ආයෝජිතයා" යන මැයෙන් නිකුත් කරන ලද 2023 අංක 01 දරන විධාන සංශෝධනය කිරීම සඳහා 2024 අංක 01 දරන විධාන නිකුත් කරන ලද අතර එමගින් මෙම ගිණුම් විවෘත කිරීමේ වලංගු කාලය 2024 ජූනි 30 දක්වා දීර්ඝ කරන ලදී.

2024 පෙබරවාරි 15 - 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී නිෂ්කාශන ආයතනයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද රීති ප්‍රකාරව "සුරැකුම්පත් ණයට ගැනීම ණයට දීම" යන ගනුදෙනු යටතේ කොළඹ කොටස් වෙළෙඳපොලේ ලැයිස්තුගත කර ඇති සුරැකුම්පත් අත්පත් කර ගැනීමට, විකිණීමට හෝ ඇපයට තැබීමට අනේවාසිකයන්ට අවසර දීමේ අරමුණින්, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/35 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති 2021 අංක 2 දරන රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 07 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ 2021 පෙබරවාරි 15 දිනැති අංක 2371/31 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කර ඇති රෙගුලාසි නිකුත් කරන ලදී. මෙම පියවර සම්බන්ධයෙන් 2024 අංක 02 දරන විධාන 2024 මාර්තු 20 වන දින බලයලත් අලෙවිකරුවන් වෙත නිකුත් කරන ලදී.

2024 පෙබරවාරි 16 - නේවාසික සමාගම්වලට අනේවාසිකයින්ගෙන් වසර 3කට අඩු කාලයක් සඳහා ණය ලබාගැනීමට ඇති අවසරය අවලංගු කිරීම සහ නේවාසික සමාගමට ප්‍රමාණවත් විදේශ විනිමය ශේෂ/මුදල් ප්‍රවාහ නොමැති විට ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීම මගින් දැනටමත් ලබාගෙන ඇති එවැනි ණය සඳහා ආපසු ගෙවීම් සිදු කිරීමට අවසර ලබා දීමේ අරමුණින් 2021 වසරේ පෙබරවාරි 03 දිනැති අංක 2213/35 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් පළ කර ඇති 2021 අංක 2 දරන රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 07 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ 2024 වසරේ පෙබරවාරි 16 දිනැති අංක 2371/48 දරන

අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති රෙගුලාසි නිකුත් කරන ලදී. මෙම පියවර සම්බන්ධයෙන් වන 2024 අංක 3 දරන උපදෙස් 2024 මාර්තු 20 වන දින බලයලත් අලෙවිකරුවන් වෙත නිකුත් කරන ලදී.

- ප්‍රමාණවත් විදේශ විනිමය ශේෂ/මුදල් ප්‍රවාහ නොමැති විට ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීම මගින් අනේවාසික පුද්ගලයන්ට හිමි ලැයිස්තුගත ණය සුරැකුම්පත් සහ ලැයිස්තුගත කොටස් සම්බන්ධ ආදායම් හෝ කල්පිරුම් සඳහා ගෙවීම් සිදු කිරීමට අවසර ලබා දීමේ අරමුණින් 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/35 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් පළ කර ඇති 2021 අංක 2 දරන රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 07 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ 2024 පෙබරවාරි 16 දිනැති අංක 2371/49 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති රෙගුලාසි නිකුත් කරන ලදී. මෙම පියවර සම්බන්ධයෙන් වන 2024 අංක 04 දරන විධාන 2024 මාර්තු 20 වන දින බලයලත් අලෙවිකරුවන් වෙත නිකුත් කරන ලදී.
- අනේවාසිකයින්ගෙන් ලබා ගත් ණය වලින් ලැබෙන මුදල් භාවිත කරමින් නේවාසික සමාගම්වලට ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල ආයෝජනය කිරීමට අවසර ලබා දී ඇති 2021 ජූනි 30 දිනැති අංක 2234/20 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති 2021 අංක 06 දරන රෙගුලාසි අවලංගු කිරීම සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 07 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ 2024 පෙබරවාරි 16 දිනැති අංක 2371/50 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවලට ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි නිකුත් කරන ලදී.

2024 ජූනි 18 - 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අතර 2023 වසරේ දෙසැම්බර් 20 දිනැති අංක 2363/26 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කරන ලද නියෝගය යටතේ පනවන ලද යම් ප්‍රාග්ධන ප්‍රවාහ පියවර කිහිපයක් ලිහිල් කිරීමේ අරමුණින් 2024 ජූනි 18 දිනැති අංක 2389/08 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති නියෝගය නිකුත් කරන ලදී.

2024 ජූලි 01 - 2024 ජූලි 01 දිනැති අංක 2391/02 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති 2024 අංක 01 දරන අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම සම්බන්ධ රීති, 2023 අංක 16 දරන මහ බැංකු පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද අතර එමගින් අපනයන ආදායම්වල ඉතිරි කොටස සම්බන්ධ අනිවාර්ය පරිවර්තනය අවශ්‍යතාව සඳහා වන කාල සීමාව පෙර රීතිවල නියම කර තිබූ පරිදි, පසු මාසයේ 07 වන දිනට සාපේක්ෂව, එම ආදායම ලැබුණු දින සිට දින දර්ශන මාස තුනක් (ලැබුණු මාසය ද ඇතුළුව) කල් ඉකුත් වීමෙන් පසුව මාසයේ 10 වන දින දක්වා දීර්ඝ කරන ලදී. පාර්ලිමේන්තු අනුමැතියෙන් පසු මෙම රීති 2024 සැප්තැම්බර් 4 දින සිට බලාත්මක විය.

2024 අගෝස්තු 01 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ වීසා වැඩසටහන යටතේ නේවාසික වීසා ලබාගන්නා විදේශිකයන්ගේ ගනුදෙනු සහ පහසුකම් සැලසීම සඳහා 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ 2024 අංක 05 දරන විධානය සහ 2024 අංක 06 දරන විධාන නිකුත් කරන ලදී.

2024 දෙසැම්බර් 19 - 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ අංක 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද 2024 ජුනි 18 දිනැති අංක 2389/08 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති නියෝග යටතේ පනවන ලද යම් ප්‍රාග්ධන ප්‍රවාහ පියවර තවත් මාස 6කට දීර්ඝ කරමින් සහ එවැනි පියවරවල ඇතැම් අඩුලුහුඩුකම් සපුරාලීමේ අරමුණින් 2024 දෙසැම්බර් 19 දිනැති අංක 2415/56 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති නියෝගය නිකුත් කරන ලදී.

රාජ්‍ය ණය කළමනාකරණය

2024 මාර්තු 11 - 2024 වසරේ මාර්තු 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි, 2024 වසරේ මාර්තු 07 වන දින නිකුත් කරන ලද සංශෝධිත විධානයන්ට අනුව, භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල දී දෙවන අදියර සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රමාණය, පළමු අදියරේ දී සමස්ත වෙන්දේසි භිගය සහ ඉදිරිපත් කරන ලද මුළු වටිනාකමින් 10%ක් හෝ රුපියල් බිලියන 5ක් (යන අගයන්ගෙන් ඉහළ අගය) දක්වා අඩු කර ඇත.

- 2024 වසරේ මාර්තු 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි, 2024 වසරේ මාර්තු 07 දින නිකුත් කරන ලද සංශෝධිත විධානයන්ට අනුව, භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවල දී සෘජු නිකුතු කවුළුව සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රමාණය, පළමු අදියරේ දී සම්පූර්ණයෙන්ම පිළිගනු ලැබූ සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංක සඳහා ඉදිරිපත් කරන ලද වටිනාකමින් 10% දක්වා අඩු කර ඇත.

2024 අප්‍රේල් 01 - රජයේ සුරැකුම්පත් ආයෝජනවලට අදාළ මුද්‍රිත කාලීන ප්‍රකාශන යැවීම අත්හිටුවනු ලැබූ අතර, එය සම්පූර්ණයෙන් ම විද්‍යුත් ප්‍රකාශන පහසුකම බවට පරිවර්තනය කරන ලදී. මේ සඳහා ලංකාසෙක්‍යු පද්ධතියේ (LankaSecure system) සියලුම සුරැකුම්පත් ගිණුම් හිමියන් සඳහා වලංගු විද්‍යුත් තැපැල් ලිපිනයන් යාවත්කාලීන කිරීම අනිවාර්ය වේ.

2024 දෙසැම්බර් 20 - විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ISBs) හුවමාරුව සුදුසුකම් ලත් බැඳුම්කර හිමියන්ගෙන් 97.86%ක ගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක විය.

- එම හුවමාරුව තුළ බැඳුම්කර හිමියන්ට උපචිත පොලී සඳහා 2028 වසරේ කල්පිරෙන බැඳුම්කරයක්, ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත ආර්ථික කාර්යසාධන හා බැඳුනු බැඳුම්කර හතරක් (04), ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත යහපාලනය හා බැඳුණු බැඳුම්කරයක් සහ එක් ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත එ. ජ. ඩොලර් බැඳුම්කරයක් පහත දැක්වෙන පරිදි නිකුත් කරන ලදී.

විස්තරය	කූපන් අනුපාතය (%)	ණය ප්‍රමාණය (එ.ජ. ඩොලර්)
උපචිත පොලී සඳහා 2028 වසරේ දී කල්පිරෙන බැඳුම්කරය	4.0	1,647,735,257
ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2030 වසරේ දී කල්පිරෙන ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරය	3.1	1,086,993,557
ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2033 වසරේ දී කල්පිරෙන ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරය	3.35	2,132,120,275
ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2036 වසරේ දී කල්පිරෙන ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරය	3.6	999,165,345
ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2038 වසරේ දී කල්පිරෙන ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරය	3.6	1,999,171,191
ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2035 වසරේ දී කල්පිරෙන යහපාලනය හා බැඳුණු බැඳුම්කරය	3.6	1,439,672,065
ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2038 වසරේ දී කල්පිරෙන එ.ජ. ඩොලර් බැඳුම්කරය	1.0	1,126,487,250

මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

මීට අමතරව, බැඳුම්කර හුවමාරුව සඳහා වූ යෝජනාව කල් ඉකුත්වන දිනට හෝ ඊට පෙර, පවතින බැඳුම්කර මාලාවක් සම්බන්ධයෙන් වන වලංගු උපදෙස් ලබා දී ඇති බැඳුම්කර හිමියන් සඳහා හුවමාරු ගාස්තු ගෙවීම් සඳහා, එ.ජ. ඩොලර් 215,237,873ක වටිනාකමින් යුත් එ.ජ. ඩොලර්වලින් නාමනය කරන ලද "හුවමාරු ගාස්තු" බැඳුම්කර නිකුත් කරන ලදී. තවද, ජාත්‍යන්තර බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමේ දේශීය විකල්පය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 155,728.6 වන නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා සම්බන්ධිත නව භාණ්ඩාගාර බැඳුම්කර අටක් (08) නිකුත් කරන ලදී.

2024 දෙසැම්බර් 30 - ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ දී ශ්‍රී ලංකා රුපියල් මගින් ණය පියවීම ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා සම්බන්ධිත නව භාණ්ඩාගාර බැඳුම්කර පහක් (05) නිකුත් කරන ලදී.

මූල්‍ය අංශය

බලපත්‍රලාභී බැංකු

2024 පෙබරවාරි 29 - ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් (PricewaterhouseCoopers) සහ එස් ජේ එම් එස් ඇසෝසියේට්ස් (SJMS Associates) යන විගණන ආයතන විසින් එම ආයතනවල නම් පිළිවෙළින් ඩෙලොයිට් පාර්ට්නර්ස් සහ ඩෙලොයිට් ඇසෝසියේට්ස් ලෙස වෙනස් කිරීමත් සමඟ, 2019 අංක 08 දරන "බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ගිණුම් ප්‍රකාශ විගණනය කිරීම සඳහා සුදුසුකම් ලත් විගණකයින්ගේ ලැයිස්තුව" යන චක්‍රලේඛයට සංශෝධන නිකුත් කරන ලදී.

2024 මාර්තු 25 - සිදුවිය හැකි ණය සංකේන්ද්‍රණ අවදානම අවම කරමින් බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාවය සහ ශක්තිමත්භාවය තහවුරු කර ගැනීම සහ මහජන විශ්වාසය ආරක්ෂා කිරීමේ අරමුණින්, 2026 වසරේ ජනවාරි 01 දින සිට බලාත්මක කිරීමට නියමිතව, "බලපත්‍රලාභී බැංකුවල විශාල ගනුදෙනු නිරාවරණයවීම්" පිළිබඳ බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

2024 මාර්තු 28 - දැනටමත් බලපත්‍රලාභී බැංකුවල ස්ථාපිත පශ්චාත් කොවිඩ්-19 යළි පණගැන්වීමේ ඒකක තවදුරටත් ශක්තිමත් කරමින් සහ එම ඒකක, ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක ලෙස වැඩිදියුණු කරමින්, සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර තිරසාර ලෙස යළි නඟා සිටුවීමට පහසුකම් සැලසීමේ අරමුණින් සහ බලපත්‍රලාභී බැංකුවල ඉහළ ගිය අක්‍රීය ණය නිසි ලෙස හැසිරවීම තහවුරු කිරීමේ අරමුණින් "බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම සඳහා වන මාර්ගෝපදේශ" පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2024 අප්‍රේල් 15 - බලපත්‍රලාභී බැංකුවල ණය පොලී අනුපාතික තවදුරටත් පහළ යාමට අවකාශය සලසා දෙමින් මුදල් ප්‍රතිපත්තිය සහ මුදල් තත්ත්වයන්හි සැලකිය යුතු ලෙස වූ ලිහිල්වීම සැලකිල්ලට ගනිමින්, 2023 වසරේ අගෝස්තු 25 දිනැති "රුපියල්වලින් නාමකරණය කරන ලද ණය උපකරණ මත වූ උපරිම පොලී අනුපාතික" පිළිබඳව වන 2023 අංක 01 දරන මුදල් නීති පනත් නියෝගය අවලංගු කරන ලදී.

2024 ජූනි 13 - 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරන බැංකු පනතේ 21(1) සහ 76(ඌ) වගන්ති ප්‍රකාරව, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය පවත්වාගෙන යාම අත්හිටුවමින්, සෑම බලපත්‍රලාභී බැංකුවක් ම, බැංකුවල ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාත ලෙස, ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථායි අරමුදල් අනුපාතය පවත්වා ගත යුතු බව නීර්ණය කරමින්, "බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාත" යන බැංකු පනත් නිර්ණය නිකුත් කරන ලදී.

2024 ජූනි 14 - 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීමත් සමඟ, අක්වෙරළ බැංකු ව්‍යාපාර පවත්වාගෙන යාමට පහසුකම් සැලසීමේ අරමුණින් "බලපත්‍රලාභී වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු" පිළිබඳ වන බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. අක්වෙරළ බැංකු ව්‍යාපාර සිදු කිරීම සඳහා අවසරලත් ව්‍යාපාර, සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්, අවසර ලත් ගනුදෙනු සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර යටතේ ලබා දිය හැකි ණය යනාදිය මෙම විධානයන් මගින් නිශ්චිතව දක්වනු ලැබේ. තවද, බැංකු (අක්වෙරළ බැංකු කටයුතු පටිපාටිය) නියෝග සහ එවැනි අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු ඒකක සඳහා අදාළ වූ නියෝග අහෝසි කරමින් බැංකු පනත් නියෝගයක් නිකුත් කරන ලදී.

- බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් 2024 ජූනි 15 දින සිට බලපැවැත්වෙන පරිදි අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සඳහා භාවිතා වන විදේශ ව්‍යවහාර මුදල් නම් කරමින්, බැංකු (අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු) නියෝගය නිකුත් කරන ලදී.

2024 ජූනි 15 - බලපත්‍රලාභී බැංකු සඳහා අදාළ වන නීතිමය සහ නියාමන රාමුව ශක්තිමත් කිරීමේ අරමුණින් කෙටුම්පත් කරන ලද බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත, 2024 අප්‍රේල් 02 දින පාර්ලිමේන්තුවේ දී අනුමත කරන ලද අතර, එය 2024 ජූනි 15 දින සිට 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත ලෙස ක්‍රියාත්මක විය. මෙම සංශෝධන මගින්, බලපත්‍රයක් අයදුම් කිරීම සඳහා වන අවම අවශ්‍යතාවයන්, කොටස් හිමියන්ගේ යෝග්‍යතාවය සඳහා වන නිර්ණායක, බැංකු හිමිකාරිත්වය, අත්පත් කර ගැනීම්, එක් කිරීම සහ ඒකාබද්ධ කිරීම, ඒකාබද්ධ අධීක්ෂණය, සමානුපාතිකත්වය, ගිණුම් සහ විගණනය පිළිබඳ අවශ්‍යතා, විශාල ගනුදෙනු නිරාවරණයන්, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු, ආයතනික යහපාලනය, අක්වෙරළ බැංකු ව්‍යාපාර යනාදිය සඳහා අදාළ වන නීතිමය ප්‍රතිපාදන ශක්තිමත් කර ඇත.

2024 ජූනි 28 - 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනතට අනුකූලව, බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ යථායෝග්‍යතාවය ඇගයීමේ නිර්ණායක ශක්තිමත් කිරීමේ අරමුණින්, එහි I වන උපලේඛනයේ දක්වා ඇති දිවුරුම් ප්‍රකාශ ආකෘති සංශෝධනය කරමින්, 2019 අංක 08 දරන "ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂකවරුන්ගේ යථායෝග්‍යතාව ඇගයීම" පිළිබඳ වන බැංකු පනත් විධානයට සහ 2019 අංක 01 දරන "බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ යථායෝග්‍යතාවය ඇගයීම" පිළිබඳ වන බැංකු පනත් නිර්ණයට සංශෝධන නිකුත් කරන ලදී.

2024 ජූලි 19 - සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය විසින් ඇපවන නිරාවරණ ප්‍රමාණය සඳහා 20%ක අවදානම මත බර තැබීමක් නියම කරමින් "බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ වන ප්‍රාග්ධන අවශ්‍යතාවන්" පිළිබඳ 2016 අංක 01 දරන බැංකු පනත් විධානවලට සංශෝධන නිකුත් කරන ලද

අතර, ඒ අනුව දක්වන ලද විධානයන්හි භාවිතය සඳහා මූල්‍ය ආයතනවල නම් ලැයිස්තුවට සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය ද ඇතුළත් කරන ලදී.

2024 අගෝස්තු 30	-	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් අදාළ පාර්ශ්වකරුවන් හා සම්බන්ධ වී ශ්‍රී ලංකාවේ “කාන්තා හිමිකාරීත්වය දරන/මෙහෙයවන ව්‍යාපාර” සඳහා නව ජාතික නිර්වචනයක් සකස් කිරීමත් සමඟ, කාන්තා ව්‍යවසායකයින් පිළිබඳ සංශෝධිත නිර්වචනය මත පදනම්ව, ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSMEs) වෙත ලබා දෙන නිරාවරණ පිළිබඳ ස්ත්‍රී පුරුෂ භාවය මත විභේදිත දත්ත වාර්තා කරන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.
2024 සැප්තැම්බර් 11	-	අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතු අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව ලංකා බැංකුව සහ මහජන බැංකුව සඳහා දස දෙනෙකු ලෙසත්, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සඳහා නව දෙනෙකු ලෙසත් නීර්ණය කරමින්, “තෝරාගත් බලපත්‍රලාභී බැංකුවල අවම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව” පිළිබඳ වන බැංකු පනත් නිර්ණය නිකුත් කරන ලදී.
2024 සැප්තැම්බර් 30	-	අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල ඵලදායී ක්‍රියාකාරීත්වය සහතික කිරීම සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු නියාමන අවශ්‍යතා වැඩිදියුණු කිරීම ඇතුළුව අවදානම් අධීක්ෂණය සහ පාලන කාර්යයන්හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම තුළින් බලපත්‍රලාභී බැංකුවල ආයතනික යහපාලන ක්‍රියාවලීන් සහ භාවිතයන් ශක්තිමත් කිරීම වැනි අරමුණු ඇතිව, “බලපත්‍රලාභී බැංකු සඳහා වන ආයතනික යහපාලනය” පිළිබඳව වන බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.
2024 ඔක්තෝබර් 01	-	බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ඇතිවිය හැකි සබැඳියාවන් පිළිබඳ ගැටුම් අවම කිරීම සහ සම්බන්ධිත පාර්ශ්වයන් හට වඩාත් වාසිදායක සැලකිල්ලක් දැක්වීම වැළැක්වීමේ අරමුණින්, බලපත්‍රලාභී බැංකුවලට අදාළ සම්බන්ධිත පාර්ශ්වයන් සහ සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දී ඇති අනුග්‍රාහක සම්බන්ධයෙන් අනුමත සුරැකුම්පත් නිශ්චිතව සඳහන් කරමින් බැංකු පනත් නිර්ණයක් නිකුත් කරන ලදී. තවද, මේ සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද බැංකු පනත් විධාන අවලංගු කරන ලදී.
2024 ඔක්තෝබර් 03	-	බලපත්‍රලාභී බැංකු විසින් අදාළ සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දෙන අනුග්‍රාහකත්ව සම්බන්ධයෙන් වන අනුමත සීමාවන් දක්වමින් ගැසට් පත්‍රයක් ප්‍රකාශයට පත් කරන ලදී.
2024 දෙසැම්බර් 03	-	ජංගම බැංකුකරණ ඒකක පිහිටුවීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින් සහ එහිදී බලපත්‍රලාභී වාණිජ බැංකු අතර ඒකාකාරී භාවිතයක් ස්ථාපිත කිරීමේ අරමුණින්, “බලපත්‍රලාභී වාණිජ බැංකුවල ජංගම බැංකු ඒකක පිහිටුවීම සඳහා වන මාර්ගෝපදේශ” යන චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2024 දෙසැම්බර් 19 - ශ්‍රී ලංකා බැංකු සංගමය එකඟ වූ පරිදි, පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ මෑත කාලීනව පැවති සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබාදිය යුතු සහන අවධාරණය කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2024 දෙසැම්බර් 31 - බලපත්‍රලාභී බැංකුවල කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය වාර්තා පුවත්පත්වල, අදාළ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සහ වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කිරීමේ ආකෘති දක්වමින්, වාර්ෂික හා කාර්තුමය මූල්‍ය තොරතුරු පුවත්පත්වල පළකිරීම සඳහා පැවති ප්‍රකාශන ආකෘති සරල කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2025 ජනවාරි 01 - බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහන සැලසීම පිළිබඳ වන 2024 අංක 04 දරන චක්‍රලේඛයෙහි දක්වන ලද සහන, සියලුම බලපත්‍රලාභී බැංකු මගින් ඵලදායී සහ ඒකාකාරී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ අරමුණින්, එම චක්‍රලේඛයෙහි අන්තර්ගතය තවදුරටත් පැහැදිලි කරමින් එකී චක්‍රලේඛයට අතිරේකයක් නිකුත් කරන ලදී.

අපේක්ෂිත - බලපත්‍රලාභී බැංකු සඳහා වන ආයතනික යහපාලනය පිළිබඳ විධාන සඳහා අතිරේකය.

- ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සම්බන්ධව බාහිරින් සේවාවන් ලබා ගැනීම පිළිබඳ විධාන.

- වෙළඳපොළ මත පදනම් වූ ඒකාබද්ධ කිරීම පිළිබඳ රාමුව.

මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්

2024 ජනවාරි 05 - ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරගෙන යාමේ අරමුණින්, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2024 වසරේ ජනවාරි 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

2024 පෙබරවාරි 13 - මුදල් සමාගම්වල ව්‍යාපාර සහ ආයතනික කටයුතු සිදු කෙරෙන ආකාරය දැනගැනීම හෝ වෙනත් යම් නිශ්චිතවූ අරමුණක් සඳහා මුදල් සමාගම්වල කාලීන, නිරවද්‍ය, අඛණ්ඩ සහ පූර්ණ තොරතුරු ලබා ගැනීමේ අරමුණින් කාලාවර්තක වාර්තා කිරීමේ අවශ්‍යතා පිළිබඳ විධානය නිකුත් කරන ලදී.

2024 මැයි 03 ණය අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය, ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය හා විචක්ෂණ සීමා ඇතුළත් ණය අවදානම් පාලන ව්‍යුහය සැකසීම සහ ණය අවදානම හඳුනාගැනීම, මැනීම, නිරීක්ෂණය සහ පාලනය සඳහා ඵලදායී පද්ධතියක් පවත්නා බවට තහවුරු කිරීම මගින් ශක්තිමත් ණය අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීමේ අරමුණින් ණය අවදානම් කළමනාකරණය පිළිබඳ විධානය නිකුත් කරන ලදී.

2024 ජූලි 05	-	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරගෙන යාමේ අරමුණින්, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2024 **වසරේ** ජූලි 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් තීරණය කරන ලදී.
2024 ජූලි 25	-	බැංකු නොවන මූල්‍ය ආයතන අංශය ඒකාබද්ධ කිරීමේ සැලැස්මේ (ඒකාබද්ධකරණ සැලැස්ම) කොටසක් ලෙස මල්ටි ෆිනෑන්ස් පීඑල්සී සමාගම, එල්බී ෆිනෑන්ස් පීඑල්සී සමඟ ඒකාබද්ධ වීමෙන් පසු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මල්ටි ෆිනෑන්ස් පීඑල්සී සමාගමට මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත (මුදල් ව්‍යාපාර පනත) යටතේ නිකුත් කර තිබූ බලපත්‍රය අවලංගු කරන ලදී. තවද, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත (කල්බදු මූල්‍යකරණ පනත) යටතේ මල්ටි ෆිනෑන්ස් පීඑල්සී වෙත නිකුත් කර තිබූ ලියාපදිංචි කිරීම බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අවලංගු කරන ලදී.
2024 ඔක්තෝබර් 22	-	කලකට ඉහතදී බලපත්‍රය අවලංගු කරන ලද ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත මුදල් ව්‍යාපාර පනතෙහි 32(4) වගන්තිය යටතේ ඈවරකරුවෙකු පත් කිරීම සඳහා නියෝගයක් කොළඹ වාණිජ මහාධිකරණය විසින් නිකුත් කරන ලදී.
2024 ඔක්තෝබර් 23	-	මුදල් සමාගම්වල අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා වැටුප් ලබා දීමේ දී ස්ථාවර බව, සාධාරණත්වය සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් වැටුප් ප්‍රතිපත්ති සහ අනාවරණ අවශ්‍යතා පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.
2024 නොවැම්බර් 21	-	තැන්පතු භාරගැනීම, වෙළඳ දැන්වීම් පළකිරීම සහ තැන්පතු දිරිගැන්වීමේ යෝජනාක්‍රම ඉදිරිපත් කිරීමට අදාළව කොන්දේසි නියම කිරීම තුළින් තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම සහ මුදල් සමාගම් අතර සාධාරණ තරගකාරීත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින්, මුදල් සමාගම් විසින් තැන්පතු කැඳවීම පිළිබඳ විධානය නිකුත් කරන ලදී.
2024 නොවැම්බර් 29	-	මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය හා කාර්ය පටිපාටි, මෙහෙයුම් අවදානම් පාලන ව්‍යුහය සහ ගනුදෙනුකරුවන්ට අඛණ්ඩව සේවා සැපයීම තහවුරු කරමින් මෙහෙයුම් අවදානම හඳුනාගැනීම, තක්සේරු කිරීම, නිරීක්ෂණය හා වාර්තා කිරීම සහ අවම කිරීම හා පාලනය, මුදල් සමාගම පුරා ක්‍රියාත්මක කිරීම සඳහා වන ඵලදායී මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලි සැකසීම තුළින් ශක්තිමත් මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීමේ අරමුණින්, මෙහෙයුම් අවදානම් කළමනාකරණය පිළිබඳ විධානය නිකුත් කරන ලදී.

2024 දෙසැම්බර් 27	-	ඒකාබද්ධකරණ සැලැස්මෙහි I වන අදියර නිමාවට පත් වීමත් සමඟ, මැදි සහ දිගු කාලයේ දී වඩාත් තිරසර මුදල් සමාගම් අංශයක් ඇති කිරීමේ අරමුණින්, ඒකාබද්ධකරණ සැලැස්මෙහි සංශෝධිත II වන අදියර මුදල් සමාගම් අංශය සඳහා හඳුන්වා දෙන ලදී. මෙම සංශෝධිත රාමුව 2025 මාර්තු 31 සිට 2028 මාර්තු 31 දක්වා විහිදෙන තුන් අවුරුදු කාලසීමාවක් තුළ ක්‍රියාත්මක වීමට නියමිතය.
2025 ජනවාරි 05	-	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරගෙන යාමේ අරමුණින්, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2025 වසරේ ජනවාරි 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් තීරණය කරන ලදී.
අපේක්ෂිත	-	මුදල් සමාගම් අංශයෙහි මැදි සහ දිගු කාලීන ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා වන ඒකාබද්ධ කිරීමේ සැලැස්මේ සංශෝධිත II වන අදියර ක්‍රියාත්මක කිරීම.
	-	මුදල් ව්‍යාපාර පනතට සහ කල්බදු මූල්‍යකරණ පනතට සිදු කරන සංශෝධන ඇතුළුව, වර්තමාන වෙළඳපොළ ප්‍රවණතා සමඟ අනුකූලවන පරිදි පවත්නා නියාමන රාමුව සංශෝධනය කිරීම.
	-	අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය ශක්තිමත් කරන අතරතුර බැංකු නොවන මූල්‍ය ආයතන අංශයෙහි ස්ථායීභාවය වැඩිදියුණු කිරීමට අදාළ නීති සහ රෙගුලාසි හඳුන්වා දීම.

රක්ෂණය[4]

2024 ජනවාරි 08	-	අංක 30 සහ අංක 35 දරන චක්‍රලේඛ අවලංගු කර එහි අවශ්‍යතා ඒකාබද්ධ කරමින් "තක්සේරුකරුවන් සඳහා සුදුසුකම් නිර්ණායක" පිළිබඳ 2024 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.
2024 ජනවාරි 09	-	වාර්තාකරණ අවශ්‍යතාවලට අනුකූල නොවීම සහ රක්ෂණ සමාගම් නියාමන පනතෙහි විධිවිධානවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් අංක 41 දරන චක්‍රලේඛය අවලංගු කරමින් 2024 අංක 02 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.
2024 පෙබරවාරි 01	-	දිගුකාලීන රක්ෂණ නිෂ්පාදිත සඳහා දායාද ජීවිත රක්ෂණ ඔප්පුවල (Endowment Policies) අවම කාල පරිච්ඡේදය සීමා කිරීම සඳහා 2024 අංක 01 දරන විධානය නිකුත් කරන ලදී.
2024 පෙබරවාරි 08	-	2016 අප්‍රේල් 07 දිනැති ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ ලිපියේ 4 වැනි ඡේදයට අනුව, අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයට සත්‍යාපනය කොට තහවුරු කර නොමැති පුද්ගලයන්ගේ නියෝජිතායතන ගිවිසුම් අවලංගු කරන ලෙස දන්වමින්, සියලුම රක්ෂණකරුවන්ට සහ තැරැව්කරුවන්ට 2024 අංක 02 දරන විධානය නිකුත් කරන ලදී.

[4] ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වන අතර, 2025 මාර්තු 07 දක්වා යාවත්කාලීන කර ඇත.

2024 පෙබරවාරි 26	-	"මෝටර් වාහන අනතුරු මගින් තුන්වන පාර්ශ්වීය වින්දිතයන්ට සිදුවන මරණ හෝ ස්ථිර අබලතා සඳහා වන්දි ලබාගත හැකි විකල්ප ක්‍රමවේදය" පිළිබඳ 2024 අංක 03 දරන චක්‍රලේඛය සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී.
2024 මැයි 08	-	කොටස් හිමියන්ට ලාභාංශ (අතුරු ලාභාංශ ඇතුළුව) ප්‍රකාශයට පත් කිරීමට හා බෙදා හැරීමට පෙර පිළිපැදිය යුතු නියමයන් සහ කොන්දේසි සඳහන් කරමින්, 2024 අංක 04 දරන විධානය රක්ෂණකරුවන් වෙත නිකුත් කරන ලදී.
2024 මැයි 14	-	ඵලදායී අධීක්ෂණය සඳහා "රක්ෂණකරුවන්, රක්ෂණ තැරැව්කරුවන් සහ රක්ෂණ නියෝජිතයින් විසින් පළ කරන ලද දැන්වීම්" සම්බන්ධයෙන් දැනට පවතින මාර්ගෝපදේශ වෙනුවට, සියලුම රක්ෂණකරුවන්, තැරැව්කරුවන් සහ නියෝජිතයින් වෙත 2024 අංක 03 දරන විධානය නිකුත් කරන ලදී.
2024 මැයි 20	-	විස්තීර්ණ මෝටර් රක්ෂණාවරණ දැන්වීම් ප්‍රචාරණයන්/ප්‍රවර්ධනයන් සමඟ එම දැන්වීම් ප්‍රචාරණයන්/ප්‍රවර්ධනයන් කෙරෙහි අවධාරණය කරනු ලබන අවස්ථාවන්හී දී හැර, තුන්වන පාර්ශ්වීය මෝටර් රක්ෂණ දැන්වීම් ප්‍රචාරණය/ප්‍රවර්ධනය කිරීම තහනම් කරමින්, සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත 2024 අංක 04 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.
2024 අගෝස්තු 09	-	රක්ෂණ ඔප්පු හිමියන් වෙත නිකුත් කරනු ලබන රක්ෂණ ඔප්පුවල සවිස්තරාත්මක ලෙස කරුණු අන්තර්ගත විය යුතු බව දන්වමින් සියලුම දිගුකාලීන රක්ෂණකරුවන් වෙත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.
2024 අගෝස්තු 22	-	ප්‍රතිරක්ෂණ විධිවිධාන සම්බන්ධ ගනුදෙනුවලට අදාළව 2017 වසරේ දී නිකුත් කරන ලද නියමයන් සහ කොන්දේසි සංශෝධනය කරමින් රක්ෂණ ක්ෂේත්‍රයට අදාළ නියමයන් සහ කොන්දේසි නිකුත් කරන ලදී.
	-	"ජංගම දුරකථන ජාල ක්‍රියාකරුවන්ගේ (Mobile Network Operators) සහ ස්ථාවර දුරකථන මාර්ග ක්‍රියාකරුවන්ගේ (Fixed Line Operators) දත්ත සහ වේදිකා පරිශීලනය කිරීම ඔස්සේ එම ක්‍රියාකරුවන්ගේ පාරිභෝගිකයන් වෙත රක්ෂණ නිෂ්පාදිත අලෙවි කිරීම" සම්බන්ධයෙන් රක්ෂණ ක්ෂේත්‍රයට 2024 අංක 05 දරන විධානය නිකුත් කරන ලදී.
2024 සැප්තැම්බර් 24	-	"රක්ෂණ සමාගම් සහ රක්ෂණ අතරමැදියන්ගේ රක්ෂණ නිෂ්පාදිත තොරතුරු ලේඛනය" සම්බන්ධයෙන් 2024 අංක 06 දරන විධානය රක්ෂණ ක්ෂේත්‍රයට නිකුත් කරන ලදී.
2024 සැප්තැම්බර් 25	-	විදේශීය සෞඛ්‍ය රක්ෂණ නිෂ්පාදිතය ස්ථානගත කිරීම සඳහා බලයලත් රක්ෂණ තැරුව්කරුවන් (විදේශීය සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා) වෙත යොමු කිරීමට ලියාපදිංචි රක්ෂණ තැරැව්කරුවන්හට අවසර ලබා දෙන "විදේශීය සෞඛ්‍ය රක්ෂණය" සම්බන්ධ අංක 11 දරන විධානය අවලංගු කරමින් 2024 අංක 07 දරන විධානය නිකුත් කරන ලදී.
2024 නොවැම්බර් 04	-	අවම ප්‍රාග්ධන අවශ්‍යතා (ශුද්ධ සහ ප්‍රකාශිත ප්‍රාග්ධන), ලියාපදිංචි ගාස්තු, ප්‍රතිරක්ෂණ තැරැව්කාර ව්‍යාපාර සඳහා ඇති අවශ්‍යතා යනාදිය සම්බන්ධයෙන් රක්ෂණ තැරැව්කරුවන් වෙත නව නීති නිකුත් කරන ලදී.

ප්‍රාග්ධන වෙළඳපොළ[5]

2024 ජනවාරි
- ෂරියා අනුකූල ණය සුරැකුම්පත් සම්බන්ධ නීති සැකසීම අවසන් කරන ලද අතර ෂරියා විද්වතුන් (Shariah Scholars) සඳහා මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කරන ලදී.
- කොළඹ කොටස් හුවමාරුවෙහි යටිතල පහසුකම් බැඳුම්කර නිකුත් කිරීමට සහ ලැයිස්තුගත කිරීමට පහසුකම් සැලැස්වීම් සඳහා වන නියාමන රාමුව සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී.

2024 මාර්තු
- ව්‍යුත්පන්න හුවමාරුවක් පිහිටුවීම සඳහා අනුමැතිය ලබා ගත් අතර, එහි මුලපිරීම මෙහෙයවීම සඳහා අනු කමිටුවක් පත් කරන ලදී.

2024 අප්‍රේල්
- තෝරාගත් ෂරියා විද්වතුන් "පරිපූරක සේවා සපයන්නන්" ලෙස ලියාපදිංචි කිරීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී.

2024 සැප්තැම්බර්
- සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ප්‍රතීතනය ලත් ෂරියා විද්වතුන් විසින් සංවර්ධනය කරන ලද 'ධවල ලැයිස්තු' (Whitelist) දර්ශක සඳහා සම්මත ෂරියා අනුකූලතා සුරැකුම්පත් පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය තහවුරු කිරීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී.
- සමාජ බැඳුම්කර හඳුන්වා දීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා ගන්නා ලදී.

2025 ජනවාරි
- 2025 - 2035 ප්‍රාග්ධන වෙළඳපොළ උපාය මාර්ගය සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී.
- තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් විසින් මෙහෙයවනු ලබන ජංගම දුරකථන පදනම් කරගත් මාර්ගගත යෙදුම් වේදිකා හරහා යොමු කරන ලද කොටස් ඇණවුම්වල එක් ඇණවුම් වටිනාකම වැඩි කිරීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී.

මූල්‍ය අංශයට අදාළ වෙනත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

ලෝක බැංකුව යටතේ ක්‍රියාත්මක වන මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය

ලෝක බැංකු ජාත්‍යන්තර සංවර්ධන සංගමය, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය[6] සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර ලෝක බැංකුව යටතේ ක්‍රියාත්මක වන මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ණය ගිවිසුම් අත්සන් කරන ලදී.

2024 ජනවාරි 31
- ලෝක බැංකු ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය[6] අතර අත්සන් කරන ලද මූල්‍ය ගිවිසුම

2024 පෙබරවාරි 01
- ලෝක බැංකු ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර අත්සන් කරන ලද ව්‍යාපෘති ගිවිසුම

2024 පෙබරවාරි 06
- මුදල්, ක්‍රමසම්පාදන හා අමාත්‍යාංශය[6] සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර අත්සන් කරන ලද අනුබද්ධ ගිවිසුම

[5] සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වන අතර, 2025 මාර්තු 07 දක්වා යාවත්කාලීන කර ඇත.

[6] ගිවිසුම් අත්සන් කරනු ලැබූ අවස්ථාවේ දී අමාත්‍යාංශයේ නම සඳහන් වූයේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යනුවෙනි.

2024 අප්‍රේල් 10 - නියාමන ආංශික අධීක්ෂණය ශක්තිමත්කිරීම හා මූල්‍ය පාරිභෝගිකයන්ට සාධාරණ ලෙස සැලකීම තහවුරුකිරීම පිණිස මූල්‍ය පාරිභෝගික අධීක්ෂණ රෙගුලාසි යටතේ වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ අංශය ස්ථාපිත කර ඇත. මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන අතර වෙළඳපොළ හැසිරීමට අදාළ ප්‍රමිතීන් සඳහා අනුකූලතාවය, නියාමනය කිරීම, ඇගයීම හා බලාත්මක කිරීම ආදියෙහි දී මෙම අංශය තීරණාත්මක භූමිකාවක් ඉටුකරයි.

2024 මැයි 21 - ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය හැසිරීම සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් සියළු මූල්‍ය සාක්ෂරතා පාර්ශ්වකරුවන් හට සාක්ෂි මත පදනම් වූ මාර්ගෝපදේශකත්වයක් සැපයීම සඳහා, මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන ජාතික උපාය මාර්ගය යටතේ, ශ්‍රී ලාංකීය මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය (2024-2028) එළි දක්වන ලදී.

2024 මැයි 30 - **රක්ෂණ වන්දි ගෙවීමේ යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ, 2024 අංක 01 දරන 'බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල තැන්පත්කරුවන් සඳහා අනන්‍ය වූ හඳුනාගැනීමේ අංක සටහන් කිරීම අනිවාර්ය කිරීම' පිළිබඳ මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදි. මේ සමඟම, 2022 අගෝස්තු 29 දිනැතිව බැංකු පනත යටතේ නිකුත් කර තිබූ 2022 අංක 07 දරන 'බලපත්‍රලාභී බැංකු විසින් තැන්පත්කරුවන් සඳහා අනන්‍ය වූ හඳුනාගැනීමේ අංක සටහන් කිරීම අනිවාර්ය කිරීම' පිළිබඳව විධානය සහ 2022 වසරේ සැප්තැම්බර් 02 දිනැතිව මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කර තිබූ 2022 අංක 03 දරන 'තැන්පත්කරුවන් සඳහා අනන්‍ය වූ හඳුනාගැනීමේ අංක සටහන් කිරීම අනිවාර්ය කිරීම' පිළිබඳව විධාන අවලංගු කරන ලදි. මෙම නව මෙහෙයුම් උපදෙස් මගින් තැන්පත්කරුවන් වෙත වන්දි ගෙවීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම මෙන්ම තැන්පත්කරුවන් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය සරල කිරීම අපේක්ෂා කෙරේ. තවද, තැන්පත්කරුවන් අනුව දත්ත රැස් කිරීමේ පද්ධතිය සඳහා සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් සාර්ථකව අන්තර්ග්‍රහණය කර ඇති අතර මේ වනවිට බලපත්‍රලාභී බැංකු ද දත්ත රැස් කිරීමේ පද්ධතිය වෙත සාර්ථකව අන්තර්ග්‍රහණය කරමින් පවතී.

2024 ජූලි 17 - **මූල්‍ය පද්ධති ස්ථායීතාවය සහ අර්බුද කළමනාකරණය**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරාකරණ ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම උදෙසා 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ අර්බුද කළමනාකරණය සඳහා ඇති සූදානම වැඩි දියුණු කරන ලදි. පුළුල් නිරාකරණ ප්‍රතිපත්ති රාමුවක් ඇති කිරීම මගින්, ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථායීතා රාමුව ගෝලීය වශයෙන් වන හොඳම භාවිතයන් සමඟ සමපාත කරවීම සිදුවන අතර, පීඩාවට පත් මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ක්‍රියාකාරී ප්‍රවේශයක් සහතික කරයි.

2024 ජූලි 31	-	**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ රක්ෂිත තැන්පතු ආපසු ගෙවීම පිළිබඳ මාර්ගෝපදේශ** ලෝක බැංකුව මගින් ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියෙහි කොටසක් ලෙස සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් හොඳම භාවිතයන්ට අනුකූලව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ රක්ෂිත තැන්පතු ආපසු ගෙවීම පිළිබඳ නව මාර්ගෝපදේශ හඳුන්වා දෙන ලදී. මෙම මාර්ගෝපදේශ මගින් රක්ෂණ හිමිකම් ගොනු කිරීමේ සහ සැකසීමේ ක්‍රියා පටිපාටි විධිමත් කිරීම සහ කඩිනම් කිරීම අරමුණු කර ගෙන ඇති අතර එමගින් රක්ෂිත තැන්පත්කරුවන්ට වැඩි ප්‍රතිලාභ ලබා දේ. ඒ අනුව, මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ කාර්ය සාධනය මත පදනම් වූ තත්ත්වය (PBC) 09 සාර්ථකව සාක්ෂාත් කර ගෙන ඇති අතර එමගින් PBC 09 සඳහා වෙන් කර ඇති අරමුදල් රදවාගැනීමට හැකියාව ලැබී ඇත.
2024 අගෝස්තු 08	-	2023 අගෝස්තු 8 වන දින නිකුත් කරන ලද 2023 අංක 1 දරන මූල්‍ය ආරක්ෂණ රෙගුලාසි 2024 වසරේ පෙබරවාරි 08 දින සිට අර්ධ වශයෙන් බලාත්මක වූ අතර 2024 වසරේ අගෝස්තු 08 වන දින සිට පූර්ණ වශයෙන් ද බලාත්මක විය.
2024 ඔක්තෝබර් 03	-	**මූල්‍ය ස්ථායීතා අරමුදල පිහිටුවීම** අර්බුද කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ නිරාකරණ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව රුපියල් මිලියන 500ක නාමික ප්‍රතිපාදනයකින් මූල්‍ය ස්ථායීතා අරමුදල ස්ථාපිත කළේය. මූල්‍ය ස්ථායීතා අරමුදලෙහි අරමුණු වන්නේ සේතු බැංකු නිර්මාණය කිරීමට පහසුකම් සැලසීම, රජය විසින් තාවකාලික මූල්‍ය සහාය සැපයීම සහ පද්ධතිමය වැදගත්කමක් හෝ බලපෑමක් ඇති බලපත්‍රලාභී බැංකු රජය විසින් ප්‍රාග්ධනීකරණය කිරීම මගින් මූල්‍ය අංශයේ ඇතිවන ගැටලුකාරී තත්ත්ව පුළුල් ආර්ථික අර්බුද දක්වා වර්ධනය නොවන බව සහතික කිරීමයි.
2024 නොවැම්බර් 01	-	2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ දක්වා ඇති පරිදි මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීමේ අරමුණට දායක වෙමින් ණය උපදේශන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය සමඟ එක්ව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.
2024 දෙසැම්බර් 27	-	**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ අරමුදල සඳහා රාජ්‍ය මූල්‍ය අතිරේක අරමුදල් සම්පාදනය කිරීම** ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ අරමුදල සඳහා රාජ්‍ය මූල්‍ය අතිරේක අරමුදල් සම්පාදනය කිරීමේ ක්‍රමෝපායන් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව සහ, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය අවබෝධතා ගිවිසුමකට එළැඹුණි.
	-	ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ 2023 අංක 01 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම පිළිබඳ 2024 අංක 02 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ විධානය ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන වෙත නිකුත් කරන ලදී.

ආනයන සහ අපනයන පාලන

2024 ජනවාරි 11	-	රජයේ ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා, තාවකාලිකව අත්හිටුවා තිබූ, තෝරා ගත් මෝටර් වාහන ආනයනය කිරීම සඳහා ඉඩසලසමින්, 2024 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2366/19 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.
2024 පෙබරවාරි 07	-	2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2312/78 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) මගින් නිකුත් කරන ලද රෙගුලාසි අංක 12(අ) සංශෝධනය කිරීමෙන් විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා සම්පූර්ණයෙන් විදුලියෙන් ධාවනය වන වාහන ආනයනය කිරීමට අවසර දී ඇති කාලය දීර්ඝ කරමින් 2024 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2370/15 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.
2024 පෙබරවාරි 19	-	අනුමත ව්‍යාපාරයක් විසින් සැකසීම සහ ප්‍රතිඅපනයනය කිරීම සඳහා තෝරාගත් කුළුබඩු (උදා: ගම්මිරිස්, සාදික්කා සහ වසාවාසි ආදිය) ආනයනය කිරීමට අවසර දෙමින් 2024 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2372/04 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහිපළ කරන ලද) නිකුත් කරන ලදී. *(මෙම රෙගුලාසි 2024 මාර්තු 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන ලදී.)*
2024 පෙබරවාරි 28	-	2022 අංක 07 දරන ගෙවීම් නියමයන් පිළිබඳ ආනයන පාලන රෙගුලාසි (අංක 2278/21 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද) මගින් නිකුත් කරන ලද ආනයන සඳහා ගෙවීම් මත ලේඛන (DP) සහ පිළිගැනීම මත ලේඛන (DA) ගෙවීම් නියමයන් සඳහා පූර්ව අනුමත කිරීමේ අවශ්‍යතාවයට අදාළ වන රෙගුලාසි අංක 6 ඉවත් කරමින්, 2024 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2373/28 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.
2024 මාර්තු 19	-	රජයේ ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා, තාවකාලිකව අත්හිටුවන ලද, තෝරාගත් වාහන ආනයනය කිරීමට ඉඩ සලසමින් 2024 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2376/14 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහිපළ කරන ලද) නිකුත් කරන ලදී.
2024 මැයි 17	-	සංචාරක අංශය සඳහා තෝරාගත් මෝටර් රථ ආනයනය කිරීමට අවසර ලබා දෙමින්, 2024 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2384/34 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.
2024 ජූලි 18	-	අනුමත ව්‍යාපාර සඳහා සැකසීම සහ ප්‍රති අපනයනය කිරීමේ අරමුණු සඳහා තෝරාගත් කුළුබඩු ආනයනය කිරීමට අවසර ලබා දෙමින්, 2024 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2393/36 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.

2024 අගෝස්තු 21	-	2022 අංක 07 දරන ගෙවීම් නියමයන් පිළිබඳ ආනයන පාලන රෙගුලාසි (අංක 2278/21 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) සංශෝධනය කිරීමෙන් බලයලත් පුද්ගලයෙකු විසින් ප්‍රාග්ධනය/ ව්‍යාපෘති ආශ්‍රිත භාණ්ඩ ඇතුළු ව තෝරාගත් භාණ්ඩ ආනයනය කිරීමට අවසර ලබා දෙමින්, 2024 අංක 11 දරන ගෙවීම් නියමයන් පිළිබඳ ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසිය (අංක 2398/18 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.
2024 සැප්තැම්බර් 11	-	2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2312/78 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද) මගින් නිකුත් කරන ලද රෙගුලාසිය සංශෝධනය කිරීම මගින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ පිහිටුවන ලද මෝටර් රථ එකලස් කිරීමේ පහසුකම් සඳහා නවතම අර්ධ වශයෙන් කොටස් වලට ගලවන ලද මෝටර් වාහන (Semi Knocked Down) කට්ටල ආනයනය කිරීමට අවසර දෙමින්, 2024 අංක 12 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2401/21 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.
2024 දෙසැම්බර් 18	-	2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2312/78 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) සංශෝධනය කිරීම මගින්, පොදු මගී ප්‍රවාහන වාහන, විශේෂ කාර්ය වාහන සහ අනෙකුත් මෝටර් රථ නොවන භාණ්ඩ ආනයනය කිරීම තාවකාලිකව අත්හිටුවීම ඉවත් කරමින්, 2024 අංක 14 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි නිකුත් කරන ලදී. (2025 ජනවාරි 27 දිනැති 2025 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි නිකුත් කිරීමත් සමග මෙම නියාමනය අවලංගු කරන ලදී)
2025 ජනවාරි 27	-	පොදු මගී ප්‍රවාහන වාහන, විශේෂ කාර්ය වාහන, වාණිජ හෝ භාණ්ඩ ප්‍රවාහන වාහන සහ අනෙකුත් මෝටර් නොවන භාණ්ඩ ආනයනය කිරීම තාවකාලිකව අත්හිටුවීම ඉවත් කරමින්, 2025 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2421/04 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද) නිකුත් කරන ලදී. (2025 ජනවාරි 31 දිනැති 2025 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි නිකුත් කිරීමත් සමග මෙම රෙගුලාසිය අවලංගු කරන ලදී)
2025 ජනවාරි 31	-	පොදු මගී ප්‍රවාහන වාහන, විශේෂ කාර්ය වාහන, වාණිජ හෝ භාණ්ඩ ප්‍රවාහන වාහන, පුද්ගලික භාවිත වාහන සහ අනෙකුත් මෝටර් රථ නොවන භාණ්ඩ ආනයනය කිරීම සඳහා පනවා තිබූ තාවකාලික අත්හිටුවීම ඉවත් කරමින්, 2025 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2421/44 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද) නිකුත් කරන ලදී.

බදු සංශෝධන

ආදායම් බදු

2024 මාර්තු 21 - 2024 අප්‍රේල් 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් රාජ්‍ය ආයතන/ පුද්ගලයන් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග නිතිපතා තොරතුරු හුවමාරු කර ගත යුතු බවට නියම කරමින් ගැසට් නිවේදනයක් (අංක 2376/25 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.

- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා
- සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා
- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා
- භාණ්ඩ, වැඩ හෝ උපදේශන හා උපදේශන නොවන සේවාවන් සැපයීම සඳහා ඕනෑම රජයේ ආයතනයක කොන්ත්‍රාත් ලබාදීම භාරව සිටින නිලධාරීන්
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරන සහ බැංකු නොවන මූල්‍ය ආයතන ද ඇතුලත්ව ඕනෑම මූල්‍ය ආයතනයක්
- කොළඹ කොටස් හුවමාරුවේ සභාපති

2024 අප්‍රේල් 04 - බදු ගෙවීමේ ක්‍රම නියම කරමින් ගැසට් නිවේදනයක් (අංක 2378/33 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.

බදු ගෙවීම් කොමසාරිස් ජනරාල්වරයාට සිදු කළ යුත්තේ පහත සඳහන් ක්‍රම භාවිතයෙන් පමණි: -

(අ) මුදල් තැන්පත් කිරීම මගින්

(ආ) ගෙවීම් ඇණවුමක් හෝ බැංකු අණකරයක් තැන්පත් කිරීම මගින්

(ඇ) මාර්ගගත බදු ගෙවීමේ පහසුකම (Online Tax Payments Platform) භාවිත කිරීම මගින්

2024 දෙසැම්බර් 11 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ VIII වන පරිච්ඡේදයේ II වන අංශය යටතේ, ගැසට් නිවේදනයේ දක්වා ඇති උපලේඛනයෙහි, අනේවාසික පුද්ගලයෙකු වෙත සිදු කරන ලද ඕනෑම ගෙවීමකින් බද්ද රඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය දක්වමින් ගැසට් නිවේදනයක් (අංක 2414/14 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.

2025 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කිරීමෙහි නියැලී සිටින සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක්ම සහ බලයලත් අලෙවිකරුවෙකුම මෙන්ම, ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කරන රඳවා ගැනීමේ නියෝජිතයන් එම ක්‍රියාපටිපාටියට අනුකූල විය යුතුය.

එකතු කළ අගය මත බදු

2024 මාර්තු 20 - 2024 ජනවාරි 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු සඳහා වන ලියාපදිංචි වීමේ සීමාව වසරකට රුපියල් මිලියන 80 සිට වසරකට රුපියල් මිලියන 60ක් දක්වා අඩු කරන ලදී (2024 අංක 16 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත).

නිෂ්පාදන/සුරා බදු

2023 දෙසැම්බර් 31 - 2024 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි පෙට්‍රල් සහ ඩීසල් මත පනවා ඇති නිෂ්පාදන බද්ද සංශෝධනය කරන ලදී (අංක 2364/36 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

විස්තරය	සංශෝධනයට පෙර පැවති බද්ද (ලීටරයකට රුපියල්)	සංශෝධිත බද්ද (ලීටරයකට රුපියල්)
ඔක්ටේන් අංක 92 සහිත පෙට්‍රල්	77.00	72.00
ඔක්ටේන් අංක 95 සහිත පෙට්‍රල්	77.00	72.00
වෙනත්	77.00	72.00
කිලෝග්‍රෑමයකට මිලි ග්‍රෑම් 10 (මිලියනයකට කොටස්) නොඉක්මවන සල්ෆර් අඩංගු සුපර් ඩීසල්	63.00	57.00
කිලෝග්‍රෑමයකට මිලි ග්‍රෑම් 10 (මිලියනයකට කොටස්) ඉක්මවන නමුත් කිලෝග්‍රෑමයකට මිලි ග්‍රෑම් 500 (මිලියනයකට කොටස්) නොඉක්මවන සල්ෆර් අඩංගු වෙනත් ඩීසල්	56.00	50.00
වෙනත්	63.00	57.00

2023 දෙසැම්බර් 31 - 2024 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි දුම්වැටි මත නිෂ්පාදන බදු සංශෝධනය කරන ලදී (අංක 2364/36 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

විස්තරය	සංශෝධනයට පෙර පැවති බද්ද (දුම්වැටි 1,000කට රුපියල්)	සංශෝධිත බද්ද (දුම්වැටි 1,000කට රුපියල්)
දිග මි.මී. 60 නොඉක්මවන සෑම දුම් වැටියක් සඳහා	16,030	18,270
දිග මි.මී. 60 ඉක්මවන එහෙත් මි.මී. 67 නොඉක්මවන සෑම දුම් වැටියක් සඳහා	41,540	47,360
දිග මි.මී. 67 ඉක්මවන එහෙත් මි.මී. 72 නොඉක්මවන සෑම දුම් වැටියක් සඳහා	59,180	67,470
දිග මි.මී. 72 ඉක්මවන එහෙත් මි.මී. 84 නොඉක්මවන සෑම දුම් වැටියක් සඳහා	67,100	76,490
දිග මි.මී. 84 ඉක්මවන සෑම දුම් වැටියක් සඳහා	74,590	85,030

2023 දෙසැම්බර් 31 - 2024 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි මධ්‍යසාර මත නිෂ්පාදන බද්ද සංශෝධනය කරන ලදී (අංක 2364/35 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

විස්තරය	සංශෝධනයට පෙර පැවති බද්ද (මද්‍යසාර ලීටරයකට රුපියල්)	සංශෝධිත බද්ද (මද්‍යසාර ලීටරයකට රුපියල්)
විශේෂ අරක්කු	6,000	6,840
ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු	6,420	7,320
දේශීය ව නිපදවන ලද "විදේශීය" මද්‍යසාර	6,600	7,525
ලේබලයෙහි දක්වා ඇති පරිදි නිරපේක්ෂ සැර 5% හෝ ඊට අඩු මෝල්ට් මද්‍යසාර	4,750	5,415
ලේබලයෙහි දක්වා ඇති පරිදි නිරපේක්ෂ සැර 5% හෝ ඊට වැඩි මෝල්ට් මද්‍යසාර	4,980	5,680
වයින්	4,750	5,415
ජපන් මද්‍යසාර වර්ගයක්	1,300	1,480
දේශීය ව නිෂ්පාදිත කිරි මුසු කර නිෂ්පාදනය කළ මද්‍යසාර	3,300	3,760
ලේබලයෙහි දක්වා ඇති පරිදි නිරපේක්ෂ සැර 4%කට වඩා නොවැඩි, දේශීය ව නිපද වූ සයිඩර්	3,600	4,105

2025 ජනවාරි 10 - දුම්වැටි මත පනවා ඇති නිෂ්පාදන බද්ද 2025 ජනවාරි 11 සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරන ලදී (අංක 2418/43 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

විස්තරය	සංශෝධනයට පෙර පැවති බද්ද (දුම්වැටි 1,000කට රුපියල්)	සංශෝධිත බද්ද (දුම්වැටි 1,000කට රුපියල්)
දිග මි.මී. 60 නොඉක්මවන සෑම දුම් වැටියක් සඳහා	18,270	19,350
දිග මි.මී. 60 ඉක්මවන එහෙත් මි.මී. 67 නොඉක්මවන සෑම දුම් වැටියක් සඳහා	47,360	50,150
දිග මි.මී. 67 ඉක්මවන එහෙත් මි.මී. 72 නොඉක්මවන සෑම දුම් වැටියක් සඳහා	67,470	71,450
දිග මි.මී. 72 ඉක්මවන එහෙත් මි.මී. 84 නොඉක්මවන සෑම දුම් වැටියක් සඳහා	76,490	81,000
දිග මි.මී. 84 ඉක්මවන සෑම දුම් වැටියක් සඳහා	85,030	90,050

- වාර්ෂික උද්ධමන ගැලපුම් දර්ශක සකස් කිරීමක් (අංක 2418/43 දරන අති විශේෂ ගැසට් නිවේදනය) මත පදනම්ව, 2025 ජනවාරි 11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි (පෙට්‍රල් සහ ඩීසල් හැර) මෝටර් රථ ඇතුළු සියලුම බදු අය කළ හැකි භාණ්ඩ සඳහා නිෂ්පාදන බද්ද 5.9%කින් වැඩි විය.

- මද්‍යසාර මත පනවා ඇති සුරා බද්ද 2025 ජනවාරි 11 සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරන ලදී (අංක 2418/42 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

විස්තරය	**සංශෝධනයට පෙර පැවති බද්ද** (ලීටරයකට රුපියල්)	**සංශෝධිත බද්ද** (ලීටරයකට රුපියල්)
විශේෂ අරක්කු	6,840	7,244
ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු	7,320	7,752
දේශීය ව නිපදවන ලද “විදේශීය” මද්‍යසාර	7,525	7,969
ලේබලයෙහි දක්වා ඇති පරිදි නිරපේක්ෂ සැර 5% හෝ ඊට අඩු මෝල්ට් මද්‍යසාර	5,415	5,735
ලේබලයෙහි දක්වා ඇති පරිදි නිරපේක්ෂ සැර 5% හෝ ඊට වැඩි මෝල්ට් මද්‍යසාර	5,680	6,015
වයින්	5,415	5,735
ජපන් මද්‍යසාර වර්ගයක්	1,480	1,567
දේශීය ව නිෂ්පාදිත කිරි මුසු කර නිෂ්පාදනය කළ මද්‍යසාර	3,760	3,982
ලේබලයෙහි දක්වා ඇති පරිදි නිරපේක්ෂ සැර 4%කට වඩා නොවැඩි, දේශීය ව නිපද වූ සයිඩර්	4,105	4,347

2025 ජනවාරි 31 - 2025 පෙබරවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යුත් වාහන සඳහා නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී (අංක 2421/42 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

ආනයන තීරු බදු

2024 ජනවාරි 06 ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම (SLSFTA) යටතේ තීරුබදු අයිතම 1,222ක් සඳහා **ආනයන තීරු බදු** (Customs Import Duty) ලිහිල්කරණ වැඩසටහනෙහි “6” කාණ්ඩය යටතේ වාර්ෂික සමාන වාරික හයෙහි දෙවන වාරිකය 2024 ජනවාරි 06 සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කරන ලදී (ආදායම් ආරක්ෂණ නියෝගය අංක 06/2023/අංක 2365/54 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2025 ජනවාරි 27 - 2023 මාර්තු 24 දිනැති අංක 2324/49 දරන ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද රේගු ආඥා පනතේ (235 වන පරිච්ඡේදය) “1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) බද්ද අදාළ වන 87 වන පරිච්ඡේදයේ අර්ථ දක්වා ඇති පරිදි, එන්ජිම, බඳ කොටස සහ කැපූ කොටස් සමඟ සවි කර ඇති වාහන, වැසි ආනයනය” ලෙස විස්තර කර ඇති පරිදි, රේගු ආඥා පනතේ (235 වන පරිච්ඡේදය) "A" උපලේඛනය යටතේ ඇමුණුම II හි නිදහස් කිරීම් (ආනයන) ලැයිස්තුවේ 33 වන අයිතමය ඉවත් කරන ලදී (අංක 01/2025 දරන ආදායම් ආරක්ෂණ නියෝගය / අංක 2421/05 දරන ගැසට් නිවේදනය).

2025 ජනවාරි 31	-	2025 පෙබරවාරි 01 වන දින සිට වසරක කාලයක් සඳහා සාමාන්‍ය සහ වරණීය පදනම මත මෝටර් රථ ආනයනය සඳහා අදාළ රේගු ආනයන බද්ද මත 50%ක අධිභාරයක් පනවන ලදී (අංක 2421/43 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

සෙස් බද්ද

2024 ජනවාරි 04	-	ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ සෙස් බද්දට අදාළ තීරුබදු ලිහිල්කරණ වැඩසටහන ප්‍රකාශයට පත් කරන ලදී (අති විශෙෂ ගැසට් නිවේදනය අංක 2365/50).
2024 සැප්තැම්බර් 05		ක්ලින්කර්, සියලු වර්ගවල පෝට්ලන්ඩ් සිමෙන්ති සහ හයිඩ්‍රොලික් සිමෙන්ති ආනයනය සඳහා අදාළ සෙස් බද්ද 2024 සැප්තැම්බර් 06 වන දින සිට සංශෝධනය කරන ලද කරන ලද අතර, පාෂාණ ගල් අපනයනය සඳහා සෙස් බද්ද පනවන ලදී (අංක 2400/25 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද (PAL)

2024 ජනවාරි 01	-	පෙට්‍රල්, ඩීසල් සහ පොහොර ඇතුළු ව ඇතැම් අයිතම මත පනවා ඇති වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද 2024 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එම බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2364/37 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2024 මාර්තු 29	-	නිශ්චිත අයිතම ආනයනය කිරීමේ දී අදාළ වන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු සහන අනුපාතික සහ අදාළ නිදහස් කිරීම්, ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ප්‍රකාශයට පත් කරන ලද අතර ලදී (අංක 2377/39 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

අනෙකුත් බදු සහ අයබදු

2024 පෙබරවාරි 01	-	කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ - රත්මලාන සහ යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ වෙතින් මෙහෙයුම් ආරම්භ කරන ගුවන් ගමන් සඳහා ගුවන් යානා මගින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන පුද්ගලයින් සඳහා අදාළ වන අපගමන බද්ද වන ඇමරිකානු ඩොලර් 60න් ඇමරිකානු ඩොලර් 30ක සහනදායී අනුපාතිකයක් ලබාදීම 2024 පෙබරවාරි 1 වන දින සිට වසරක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී (අංක 2369/27 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2024 මාර්තු 07	-	2024 මාර්තු 07 වන දින සිට 2026 දෙසැම්බර් 31 වන දින දක්වා වසර තුනක පමණ කාලයක් සඳහා, ඇමරිකානු ඩොලර් 60ක බද්ද වෙනුවට, මගී යාත්‍රා (Ferry) මගින් ශ්‍රී ලංකාවෙන් පිටවන මගියෙකුගෙන් අය කරන අපගමන බද්ද ඇමරිකානු ඩොලර් 5 ක් ලෙස සහනදායී අනුපාතිකයක් සහ සහ මගී නෞකා (Cruise) මගින් ශ්‍රී ලංකාවෙන් පිටවන මගියෙකුගෙන් අය කරන අපගමන බද්ද ඇමරිකානු ඩොලර් 20 ක් ලෙස සහනදායී අනුපාතිකයක් ලබා දෙන ලදී. (අංක 2374/19 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2024 මාර්තු 20 - සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා අදාළ ලියාපදිංචි සීමාව 2024 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂික ව රුපියල් මිලියන 120 සිට රුපියල් මිලියන 60 දක්වා අඩු කරන ලදී (2024 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (සංශෝධන) පනත).

2025 ජනවාරි 31 2025 පෙබරවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෝටර් රථ මත සුඛෝපභෝගී බද්ද සඳහා වන සීමා සංශෝධනය කරන ලදී (අංක 2421/41 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

රාජ්‍ය වියදම

2024 ජනවාරි 10 - වියදම් පාලනය කිරීමේ අරමුණින්, මහා භාණ්ඩාගාරය විසින් කලින් කලට නිකුත් කරන ලද චක්‍රලේඛවල විධිවිධාන ඒකාබද්ධ කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. එමගින් වියදම් අවම කිරීමට සහ ආයතනවල ස්වභාවයට ගැළපෙන වියදම් පාලන පියවර ක්‍රියාත්මක කිරීමට උපදෙස් සපයන ලදී (ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024).

2024 පෙබරවාරි 19 - 2024 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අස්වැසුම සුභසාධන ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රම කාර්යසටහන් හඳුන්වා දෙන ලදී (අංක 2372/03 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2024 පෙබරවාරි 28 - රජයේ සීමිත ආදායම් උත්පාදන මාර්ග, වැඩිවන වියදම් සහ සීමිත මූල්‍ය අවකාශය සැලකිල්ලට ගෙන, දැඩි මූල්‍ය විනයක් පවත්වා ගැනීම, වියදම් සීමා කිරීම සහ ව්‍යාපාර තිරසාරභාවය සහතික කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසායන් (SOEs) වෙත උපදෙස් නිකුත් කරන ලදී (රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024).

2024 මැයි 17 - අස්වැසුම සුභසාධන ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රම කාලසටහන් 2024 ජුනි 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දෙන ලදී (අති විශේෂ ගැසට් නිවේදනය අංක 2372/03).

2024 ජූලි 31 - 2024 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, අස්වැසුම ප්‍රතිලාභීන් විසින් බලපත්‍රලාභී බැංකුවලින් ලබා ගන්නා ලද උකස් අත්තිකාරම් සඳහා පොලී සහනාධාරයක් ලබා දීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී (සංවර්ධන මුදල් චක්‍රලේඛ අංක DFD/2024-2).

2024 නොවැම්බර් 06 - 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ VIII කොටසේ 39 වන වගන්තිය යටතේ දක්වා ඇති ව්‍යවස්ථාපිත අරමුදල් පිළිබඳ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 වන වගන්තියට අනුව, නිශ්චිත අරමුණක් සඳහා නීතියෙන් නිශ්චිතව නම් කර නොමැති ඕනෑම අරමුදලක් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව අවධාරණය කරන ලදී (රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2024).

2024 දෙසැම්බර් 21 - අස්වැසුම සුභසාධන ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමය සඳහා වන කාර්යසටහන් මෙම ගෙවීම් යෝජනා ක්‍රමයට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දෙන ලදී (අති විශේෂ ගැසට් නිවේදනය අංක 2415/66).

අනෙකුත්

2024 ජූනි 18	-	2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.
2024 අගෝස්තු 08	-	2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.
2024 අගෝස්තු 09	-	2024 අංක 45 දරන ආර්ථික පරිවර්තන පනත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.